දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280
ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

මගේ අංකය / எனது இல / My No. ) **CF/EXQ/05/2020**
ඔබේ අංකය / உமது இல / Your No. : )
දිනය / திகதி / Date ) 2021/04/09

**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**சுகாதார அமைச்சு**
**Ministry of Health**

---

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 - 30 /2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් (උතුරු මැද, උතුරු, සබරගමුව, බස්නාහිර, දකුණු, නැගෙනහිර හා මධ්‍යම පලාත්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, (උතුරු මැද, උතුරු, සබරගමුව, බස්නාහිර, දකුණු, නැගෙනහිර හා මධ්‍යම පලාත්)
රේඛීය අමාත්‍යංශ යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, (උතුරු මැද, උතුරු, සබරගමුව, බස්නාහිර, දකුණු, නැගෙනහිර හා මධ්‍යම පලාත්)
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL – 02 – 2006 (ඒ)) වැටුප් පරිමාණයට අදාල තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020 (දෙවන වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL – 02 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරු සඳහා **11 ශ්‍රේණියට උසස්වීමක් ලබා වසර 03ක් ගතවීමට පෙර සමත් වියයුතු වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2021.06.06** දින සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය නිලධර සේවා ගණයට (PL – 02 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරක (පින්තාරුකරු, ෆෝර්ක් ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු, ජනක යන්ත්‍ර ක්‍රියාකරු **(පැරණි තනතුර යන්ත්‍ර ක්‍රියාකරු)** බොයිලේරු ක්‍රියාකරු, සපත්තු සාදන්නා, විකලාංග කාර්මික සහයක **(පැරණි තනතුරු වන ගාත්‍රා සාදන්නා හා ශල්‍ය උපකරණ සාදන්නා)**, සත්ව පරිපාලක, අඳුරු කාමර සහායක, කිට විද්‍යා ක්ෂේත්‍ර උපස්ථායක, ජලනල කාර්මික/පොම්ප ක්‍රියාකරු, සංචාරක බංගලා භාරකරු, කරණවෑම්, වඩු කාර්මික, සම්වැඩකරු, වැද්දුම්කරු, පැස්සුම්කරු, බෙලෙක් වැඩකරු, ක්‍රෝසෙටියර්, ලියවන පට්ටල්කරු, පෙදරේරු, කම්මල්කරු, අරක්කැමි, මැහුම් ක්‍රියාකරු / ක්‍රියාකාරිණී **(පැරණි තනතුර මැහුම් සේවක, මැහුම් සේවිකා)**, චිත්‍ර ශිල්පී, සෞඛ්‍ය රසායනාගාර සහයක **(පැරණි තනතුර රසායනාගාර සහයක)**, උපස්ථායක/ උපස්ථායිකා, දුරකථන ක්‍රියාකරු, රෝහල් ඕවර්සියර්) ii ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති/ උසස් කර ඇති සහ මේ වනවිට විභාගය සම්පූර්ණ නොකරන ලද නිළධාරීන් මෙම විභාගයට අයදුම් කළ යුතුය.

**සැ.යු: 2021.05.05 දින වනවිට 11 ශ්‍රේණියට පත්කර හෝ අන්තර්ග්‍රහණයකර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

## 03. **කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් නිදහස් වන නිලධාරීන්**

(i) 2012.08.14 දිනට පහත තනතුරක අවම වශයෙන් වසර 13ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර ඇති නිලධරයන් එම තනතුරට අදාල 11 ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. 1999.08.14 දිනට පෙර අදාල තනතුරට පත්වීම් ලබා 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන් මේ යටතට අයත් වේ.)

- i. **ශල්‍ය උපකරණ සාදන්නා**
- ii. **සම් වැඩකරු**
- iii. **මැහුම් ක්‍රියාකරු/ ක්‍රියාකාරිණි**
- iv. **පින්තාරුකරු**
- v. **වැද්දුම්කරු**
- vi. **කම්මල්කරු**
- vii. **කරණවෑම්**
- viii. **මෝටර් ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු**
- ix. **සෞඛ්‍ය රසායනාගාර සහයක**
- x. **පැස්සුම්කරු**
- xi. **ගාත්‍රා සාදන්නා**
- xii. **යන්ත්‍ර ක්‍රියාකරු**

(ii) 2006.01.01 දිනට පෙර පහත සඳහන් තනතුරක පත්වීමක් ලැබ 2012.08.14 දිනට එම තනතුරේ අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර ඇති 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන් එම තනතුරට අදාල 11 ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ.

- i. **සපත්තු සාදන්නා**
- ii. **සත්ව පරිපාලක**
- iii. **අදුරු කාමර සහායක**
- iv. **ජලනල කාර්මික**
- v. **වඩු කාර්මික**
- vi. **ක්‍රෝසෙටියර්**
- vii. **පෙදරේරු**
- viii. **සංචාරක බංගලා භාරකරු**
- ix. **අරක්කැමි**
- x. **චිත්‍ර ශිල්පී**
- xi. **ලියවන පට්ටල්කරු**
- xii. **බෙලෙක් වැඩකරු**
- xiii. **රෝහල ඕවර්සියර්**
- xiv. **දුරකථන ක්‍රියාකරු**
- xv. **උපස්ථායක/ උපස්ථායිකා**
- xvi. **කිට විද්‍යා ක්ෂේත්‍ර උපස්ථායක**

## 04. **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය", සෞඛ්‍ය අමාත්‍යංශයේ අධ්‍යක්‍ෂ (විභාග) වෙත **2021.05.05** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවර 02 ක්ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු.:- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## 05. **විභාග ගාස්තු**

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 06. **විභාගයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්‍ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්‍ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

- (අ) ජාතික හැඳුනුම්පත
- (ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් හෝ ඊට අදාල ආයතනයක් මගින් විධිමත්ව නිකුත් කරනු ලබන හැඳුනුම්පත
- (ඇ) වලංගු රියදුරු බලපත්‍රය
- (ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

07. විභාග පරිපාටිය

- මෙම විභාගය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි යනුවෙන් හා විෂය දැනුම යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.
- **ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය බහුවරණ හා ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. කාලය පැය 02කි. මුළු ලකුණු 100ක් වන අතර සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය.**
- **විෂය දැනුම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. කාලය පැය 01කි. මුළු ලකුණු 100ක් වන අතර සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය.**

08. විෂය නිර්දේශ මාලාව

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් පහත කරුණු :<br>• ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද -<br>**සේවය අවසන් කිරීම - (V)**<br>**නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා - (VIII)**<br>**ගමන් වියදම් - (XIV)**<br>**වැටුප් ණය සහ අත්තිකාරම් - (XXIV)**<br>• මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත කරුණු ඇතුළත් රෙගුලාසි - **බලය දීම - මු.රෙ. 136, අනුමත කිරීම - මු.රෙ. 137, සහතික කිරීම - මු.රෙ. 138, ගෙවීම - මු.රෙ. 139, පාඩු හා අත්හැර දැමීම් - මු.රෙ. 101 සිට මු. රෙ 113 දක්වා** |
| තනතුරට අදාලව විෂය දැනුම | රාජකාරියට අදාල විෂය දැනුම :<br>**වෘත්තියෙහි නිතර භාවිතා කරන උපකරණවල නම්, ඒවා නඩාගන්නා පිළිවෙල, තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවය අත්පත් කර ගෙන ඇත්දැයි බැලීම.** |

09. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

10. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු සියළුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය නිලධර සේවා ගණයට (PL – 02- 2006 (ඒ)) වැටුප් පරිමාණ නියම කර ඇති II ශ්‍රේණියට උසස් වීමක් ලබා සිටින නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. (මෙම තොරතුරු WWW.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැක.

*සැ.යු. - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල , දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.*

**චාමික එච්. ගමගේ**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**"සුවසිරිපාය"**
**කොළඹ 10.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 11
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

EXQ

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL – 02 – 2006 (ඒ)) වැටුප් පරිමාණයට අදාල තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020 (දෙවන වාරය)**

01. (අ) i. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................................................

..........................................................................................................

ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

iii. මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................................

..........................................................................................................

iv. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)

i. තනතුර ..........................................................................................................

ii. II ශ්‍රේණියට පත්කළ හෝ අන්තර්ග්‍රහණය කල දිනය .............................. ලිපි අංකය..............................

iii. දැනට ලබන වාර්ෂික වැටුප ..........................................................................................................

iv. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

v. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (✓) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ☐ විෂය දැනුම ☐

03. (අ) i. දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්)..........................................................................................................

(ඉංග්‍රීසියෙන්)..........................................................................................................

ii. එය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට ☐

පලාත් සභාවට ☐ පලාත ..............................................

(ආ) සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය ..........................................................................................................

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02 ක් අයදුම්පත්‍රයට අමුනන ලද්දේද? ..........................................................................................................

(ඈ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) ..........................................................................................................

..........................................................................................................

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..........................................................................................................

..........................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..........................................................................................................

05. (i) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ……………………………………………………………………………

(ii) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?……………………………………………

| මුද්දර කොටුව |
|---|
| |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථමවරට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රුः …………….. ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නිතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

දිනය ………………………… …………………………

අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ /නිලධාරියගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ………………………… …………………………

නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

…………………………………………………………මහතා / මහත්මිය / මෙනවිය ……………………………………… නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත්කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්/ නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, රුः……………ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවද, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

දිනය ………………………… …………………………

ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

…………………………………………………………….. මහතා / මහත්මිය / මෙනවිය,* …………………………… …………………………. නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ………………………… …………………………

විමධ්‍යගත කොට්ඨාශ විශේෂිත ව්‍යාපාර
ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

*(අනවශ්‍ය කොටස් කපා හරින්න)